**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය - 2017**
**-----------------------------------------------------------------------**

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**------------------------------------------**

2012-2016 කාලපරිච්ඡේදය තුලදී තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් ආයතනය විසින් එම කාලපරිච්ඡේදය තුලදී දරා ඇති රු.4,209,066 කින් පර්යේෂණ වියදම වූ රු.363,646 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.466,043 ක කුලී ආදායම ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියක් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.3,545,744 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙන යන ඉදිකිරීම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත සේවා සැපයීම සඳහා එළැඹි බදු ගිවිසුම ප්‍රකාරව 2014 නොවැම්බර් සිට 2015 ජූලි දක්වා ලැබිය යුතු රු.729,296 ක් වූ කුලී ආදායම් 2018 අගෝස්තු වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) වසර 03 ඉක්මවා ඇති වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන්ගේ මුළු වටිනාකම රු. 1,926,039 ක් වූ අතර මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි,

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,164,058 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,287,030 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,451,088 ක වර්ධනයක් දක්නට ලැබුණි. ව්‍යාපෘති සඳහා වියදම් රු.2,818,000 කින් හා සේවක පාරිශ්‍රමික රු.7,264,000 කින් වැඩි වුවද සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.36,415,000 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු. 5,957,641ක් වූ අතිරික්තය 2015 වර්ෂය වනවිට රු.9,511,887 ක් දක්වා වර්ධනය වී 2016 වර්ෂයේදී රු.15,287,030 ක ඌනතාවයක් වී තිබුණද 2017 වර්ෂයේදී රු.10,164,058 ක අතිරික්තයක් දක්වා නැවතත් වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 71,098,467ක් වූ ආයතනයේ දායකත්වය 2017 වර්ෂයේදී රු.123,835,922 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

ආයතනයේ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාවේදී පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ ආරම්භකර තිබූ තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීම සඳහා අඩු පිරිවැය යන්ත්‍රයක් නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා 2016 දෙසැම්බර් 31 වන විට රු.4,209,066 ක් වියදම් දරා තිබුණි. නමුත් එතෙක් සිදුකළ ක්‍රමවේදයෙහි පැවති දුර්වලතා හේතුවෙන් 2016 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක් සමඟ රු.8,000,000 ක මුදලකට මෙම යන්ත්‍රය නිපදවීම සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණි. අදියර 4 කින් යුත් මෙම ව්‍යාපෘතියෙහි ගිවිසුම ප්‍රකාරව 2017 අගෝස්තු වන විට යන්ත්‍රයේ වැඩ අවසන් කොට තාක්ෂණික පැවරුම් ලබාගත යුතු වුවත් 2018 අගෝස්තු වන විටත් දෙවන අදියරේ වැඩ සිදු කරමින් පැවතුණි.

(ආ) ආයතනයේ අංශ 3 කින් පැවැත්වීමට සැලසුම්කර තිබූ පාඨමාල 6ක් සඳහා සම්පත් දායකයින් නොමැති වීමත්, පාඨමාලා සඳහා ඉල්ලුමක් නොමැති වීමත්, පාඨමාලා අන්තර්ගතයන් සංශෝධනය නොකිරීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම පාඨමාලා පවත්වා නොතිබුණි. ආයතනයෙහි මාධ්‍ය ඒකකයක්ද පැවතියද නවීන තාක්ෂණය සම්බන්ධ මෙවැනි පාඨමාලා ප්‍රචලිත කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ආයතනයේ පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීමේ (RFID Library Automation System) ව්‍යාපෘතියක් තොරතුරු තාක්ෂණ අංශය සමඟ ඒකාබද්ධව සන්නිවේදන අංශය මඟින් 2013 වර්ෂයේදී ආරම්භකර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.93,486 ක පිරිවැයක් දරා තිබුණි. එසේ වුවද 2018 අගෝස්තු වන විටත් එය අවසන් කර නොතිබුණි.

(ඈ) ආයතනය සඳහා ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමේ කාර්යය වසර කිහිපයක සිට සිදුකරනු ලැබුවද 2018 අගෝස්තු වන තෙක් එම කාර්යය නිමකර නොතිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.75,000 ක් දරා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම ආයතනයෙහි ප්‍රධාන අරමුණ වුවත්, ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුතු කාර්ය මණ්ඩලයෙහි ධාරිතා සංවර්ධනය සඳහා වෙන්කළ රු. 3,700,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් ද සකස් කර නොතිබුණි.

(ඊ) ආයතනය විසින් හඳුන්වා දී තිබූ නවීන තාක්ෂණ ව්‍යාපෘති තුනක් සමාලෝචිත වර්ෂයේදී වාණිජකරණය කිරීමට අපේක්ෂාකර තිබුණද කිසිදු තාක්ෂණයක් වාණිජකරණය කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෘථිවි නිරීක්ෂණ දත්ත ලබා ගැනීම හා දත්ත හුවමාරුකිරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් ආයතන විසින් චීන නියෝජිත ආයතනයක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර ඒ සඳහා කිසිදු සැලැස්මක් නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘති සඳහා, භූමිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආයතනය වෙත නීත්‍යානුකූල ලෙස අයිතියක් නොමැති භූමියක් තෝරාගෙන තිබුණද චීන නියෝජිත ආයතනය විසින් පසුව සිදුකල නිරීක්ෂණ චාරිකා වලදී එම භූමිය ව්‍යාපෘතිය සඳහා සුදුසු නොවන බැවින් වෙනත් භූමියක් සොයාගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණි. කෙසේ වුවද 2018 අගෝස්තු මාසය වන විටත් සුදුසු භූමියක් විධිමත්ව පවරාගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ජාතික තාරකා විද්‍යා නිරීක්ෂණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය උපකරණයක් වන දුරේක්ෂයක් නොතිබීම හේතුවෙන් 2016 හා 2017 වර්ෂවලදී එම ව්‍යාපෘතියේ කටයුතු සිදුකර නොතිබුණි. 2018 පෙබරවාරි මාසයේදී වටිනාකම රු.3,284,150 ක් වූ දුරේක්ෂයක් මිලදී ගෙන තිබුණද, 2018 අගෝස්තු වන තෙක් එම උපකරණයේද තත්ත්ව පරීක්ෂාව සිදු කර නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය තව දුරටත් ප්‍රමාද වී තිබුණි.

(ඇ) ආයතනය විසින් කෘෂිකාර්මික නියඟ අධීක්ෂණය හා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් සකස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භකර තිබුණි. පැලෑටිවල වියළිභාවය පද්ධතිය තුලින් හඳුනාගැනීම සහ පියවි ඇසින් හඳුනා ගැනීම සමාන දැයි පරීක්ෂා කිරීමේ අදියරෙහි මෙම ව්‍යාපෘතිය පවතින අතර පියවි ඇසින් නිරීක්ෂණය කර දත්ත ලබා ගැනීමේ කාර්යය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආයතන 7කට පවරා තිබුණද එම ආයතන මෙම කාර්යය සඳහා අවශ්‍ය දත්ත ලබා දී නොමැති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ආයතනය විසින් එම කෘෂිකාර්මික ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.875,725 ක වියදමක් දරා තිබුණි.

(ඈ) ආයතනය විසින් අධි තාක්ෂණික ආරක්ෂක කැමරා පද්ධති සවි කිරීමේ සේවාවන් සපයනු ලබන අතර 2012 - 2017 කාලපරිච්ඡේදය තුලදී ඒ සඳහා එක් ඇණවුමක් පමණක් ලැබී තිබුණි. ඒ වෙනුවෙන් රු. මිලියන 8 ක ආදායමක් උපයා තිබූ අතර තවදුරටත් වෙනත් සේවාදායකයින් සඳහා එම සේවා සැපයීම් අවස්ථා වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි ආයතනය උනන්දුවී නොතිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2012 වර්ෂයේ සිට උපයෝජනයකින් තොරව පවතින පිරිවැය රු. 4,091,099 ක් වූ තොග අතරින් භාවිතයට ගත නොහැකි තොග හා සෙමින් චලනය වන තොග හඳුනාගෙන අපහරණය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

### 4.4 නිෂ්ක්‍රීය වත්කම්

පුරාවිද්‍යා ගවේශන හා කැනීම් සඳහා සහ වෙනත් රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන් සඳහා ඡායාරූප ලබා ගැනීම වෙනුවෙන් 2016 වර්ෂයේ දී රු.10,564,677 ක් වැයකර නියමුවන් රහිත යානයක් මිල දී ගෙන තිබුණ ද 2018 අගෝස්තු වන විටත් ඉන් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 177 ක් හා තත්‍ය කාර්යය මණ්ඩලය 102 ක් වීමෙන් පුරප්පාඩු 75 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට තනතුරු 27 ක පුරප්පාඩු 85 ක් පැවතියද, තනතුරු 8 ක පුරප්පාඩු පිරවීම සඳහා පමණක් පුවත්පත් දැන්වීම් පලකර තිබුණු අතර ඉන් තනතුරු 4 ක පුරප්පාඩු 18 ක් පමණක් වර්ෂය තුළදී සම්පූර්ණ කර තිබුණි.

(ඇ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ඍජුවම සම්බන්ධ වන තනතුරුවල වර්ෂ කිහිපයක සිට සියයට 50 කට වැඩි පුරප්පාඩු පැවතීමත්, එම තනතුරුවල සේවකයින් රඳවාගැනීමේ අපහසුතාවයත් ආයතනයෙන් අපේක්ෂිත අරමුණු කරා ලඟා වීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි බැවින් ඒ සම්බන්ධයෙන් පවතින ගැටලු සමාලෝචනය කර එම ගැටළු විසඳා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත් වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණ කාලීන නිළධාරියකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම් නොපමාව සිදුකල යුතුය. එසේ වුවද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 3 ක් හා අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2013 සහ 2015 වර්ෂවල සිට වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුනු අතර 2013 වර්ෂයේ සිට 2018 අගෝස්තු දක්වා වර්ෂ 5 ක කාලය තුලදී එම පුරප්පාඩු සඳහා ස්ථිරව බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය”අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය විසින් තම විෂය පථය යටතේ වන කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, පුහුණු සේවකයන් හෝ භෞතික පහසුකම්වල අවශ්‍යතාවයන් ද හඳුනා ගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 6.1 ප්‍රසම්පාදනය

--------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ප්‍රකාරව රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තු සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් වටිනාකම රු. 17,968,823 ක් වූ ප්‍රසම්පාදනයන් 11 ක් වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) ශ්‍රවණාගාරය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය හා ආලෝකකරණ පද්ධතියක් (Audio Visual & Lightning System) ස්ථාපිත කිරීම

----------------------------------------------------------------------------------------------

ශ්‍රවණාගාරය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂාකර හා ක්‍රියාත්මක කර පෙන්වීමේ කොන්ත්‍රාත්තුවක් රු.6,222,011 ක ඇස්තමේන්තු වටිනාකමකට (බදු සහිත) කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි.

(i) මෙවැනි පද්ධතියක අවශ්‍යතාවය 2016 ජූලි 22 දින පාලන අංශයෙන් දන්වා තිබුණද, කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා 2017 නොවැම්බර් දක්වා වර්ෂ 01 කට වැඩි කාලයක් ගතවී තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුට රු.1,127,872 ක අත්තිකාරමක් ගෙවා තිබුණු අතර භාණ්ඩවලින් කොටසක් සපයා තිබුණි. එහෙත් පාලන මැදිරියෙහි බිම අවශ්‍ය පරිදි සකස් නොකිරීමත්, අවශ්‍ය ලී බඩු සපයා නොගැනීමත්, ශ්‍රවණාගාරයෙහි ජල කාන්දු සිදු වීමත් හේතුවෙන් 2018 අගෝස්තු වන විටත් අනෙකුත් භාණ්ඩ ස්ථාපිත කර, කොන්ත්‍රාත්තුවේ කටයුතු නිම කිරීමට හැකිවී නොතිබුණි. කෙසේ වුවද මේ සඳහා ලබාගත් කර්යසාධන ඇපකරයද 2018 අගෝස්තු 22 දිනෙන් අවසන් වී තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | (i) ලියාපදිංචි තැපෑලෙන් ලංසු ආරාධනා යැවූ බව සඳහන් කළද ඒ සඳහා සාක්ෂි ලිපි ගොනුතුල නොවීම |
| | (ii) ප්‍රසම්පාදන ප්‍රගති වාර්තාව ප්‍රසම්පාදන සැලැස්ම සමඟ සැසඳීමට හැකි පරිදි සකස් නොකිරීම |
| | (iii) කාර්යසාධන ඇපකර ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදු වීම |
| | (iv) භාණ්ඩ හා සේවා මිලදී ගැණුම්වලදී මිලදී ගැණුම් ඇණවුමෙහි සඳහන් කොන්දේසි ප්‍රකාරව නියමිත දිනට කලින් භාණ්ඩය හෝ සේවාව සැපයීමට නොහැකිවන අවස්ථාවලදී ප්‍රමාද ගාස්තු අයකිරීම වෙනුවට සැපයීම් කාලය දීර්ඝ කර දීම. |
| | (v) භාණ්ඩ ලැබීම් පත්‍රිකා නිකුත් කිරීමේදී ප්‍රමාදයන් පැවතීම හා නිකුත් නොකළ භාණ්ඩ පැවතීම. |
| (ආ) ප්‍රගති වාර්තා පිළියෙල කිරීම. | (i) ප්‍රගති වාර්තාවල භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මක ලෙස දක්වා නොතිබීම. |
| | (ii) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් එක් එක් ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රගතිය ප්‍රගති වාර්තාවල වෙන වෙනම දක්වා නොතිබීම. |